# සමස්ත ලංකා පාසල්

# නැටුම් හා මුද්‍රා නාට්‍ය තරගය - 2011



සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව.
අධ්‍යාපන අමාත්‍යාංශය.
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

ඊඩී/1/1/1/5-2011
සෞන්දර්ය අංශය,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2010. 12. 08 දින

(සැ. යු. තරගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර
මෙම චක්‍රලේඛය කියවා නිවැරදිව අවබෝධ කර ගත යුතු ය).

***චක්‍රලේඛ අංකය 2011/01***

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
නැටුම් විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
නැටුම් ගුරු උපදේශකවරුන් සහ
විදුහල්පතිවරුන් වෙත,

## <u>සමස්ත ලංකා පාසල් නැටුම් හා මුද්‍රා නාට්‍ය තරගය - 2011</u>

මගේ අංක ඊඩී/1/1/1/5 - 2010 - 2 හා 2010. 01. 01 දිනැති චක්‍රලේඛ අංක 2010/ 01 හා බැදේ. ***(2010 වසරේදී අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඔබ විදුහලට එවා ඇති සමස්ත ලංකා පාසල් නැටුම් හා මුද්‍රා නාට්‍ය තරගය - 2010 චක්‍රලේඛය මේ සමග අනිවාර්යයෙන්ම පරිශීලනය කළ යුතු බව අවධාරණය කරමි)***

02. එම චක්‍රලේඛයේ සංශෝධිත වගන්ති හැර අනෙක් සියලුම කොන්දේසි හා පොදු නීති රීති එලෙසින්ම 2011 වර්ෂය සදහා ක්‍රියාත්මක වේ.

03. එම චක්‍රලේඛයේ සංශෝධිත වගන්ති හා පොදු නීති රීති වනුයේ,

***<u>01. තරගය</u>***

01.01. පාසලේ ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල් වර්ග තුනකට බෙදා මෙම තරගය පවත්වනු ලැබේ.

I – සිසුන් 500ට අඩු පාසල් වර්ගය - ඉදිරිපත් විය හැකි ප්‍රසංග අංක දක්වා ඇත.

II – සිසුන් 501 සිට සිසුන් 1000 දක්වා පාසල් වර්ගය } සියලුම ප්‍රසංග අංක වලට ඉදිරිපත් විය හැක.
III– සිසුන් 1000ට වැඩි පාසල් වර්ගය.

01.02. සහභාගී වන තරගකරුවන් ප්‍රධාන අංශ හයකට බෙදේ.

| | | | | |
|---|---|---|---|---|
| 1. | ප්‍රාථමික අංශය | - | 1 | සිට 5 ශ්‍රේණිය දක්වා |
| 2. | කනිෂ්ඨ අංශය | - | 6 | සිට 9 ශ්‍රේණිය දක්වා |
| 3. | ජ්‍යෙෂ්ඨ අංශය | - | 10 | සිට 13 ශ්‍රේණිය දක්වා |
| 4. | විවෘත අංශය | - | 6 | සිට 13 ශ්‍රේණිය දක්වා |
| 5. | දෙමළ මාධ්‍ය පාසල් අංශය | - | 7 | සිට 13 ශ්‍රේණිය දක්වා |
| 6. | ජාත්‍යන්තර පාසල් අංශය | - | 7 | සිට 13 ශ්‍රේණිය දක්වා |

***<u>02. සහභාගීත්වය</u>***

02.03 විශේෂයෙන් ම නැටුම් ගුරුවරුන් සේවයේ යෙදී සිටින පාසල් මෙම තරගයට අනිවාර්යයෙන් ම සහභාගී විය යුතු ය. **තම නිර්මාණ පුහුණුකිරීම සඳහා සම්පත්දායක සේවය ලබා ගත හැක්කේ තම කලාපයේ ගුරු උපදේශක නර්තන/ සංගීත, විෂය භාර අධ්‍යක්ෂ හා පළාත් විෂයභාර නි. අ. අ./ ස. අ. අ. ගෙන් පමණි. වෙනත් කිසිදු බාහිර සම්පත් දායකයෙකුගේ සේවය ලබා ගත නොහැකිය. එසේ බාහිර පුද්ගලයින්ගේ සේවය ලබා ගත් බවට තරග අවස්ථාවට පෙර හෝ තරග අවස්ථාවේ දී හෝ තරගය පැවැත්වීමෙන් පසු හෝ තොරතුරු අනාවරණය වුවහොත්, ඔබ පාසල ඉදිරිපත් කරන ප්‍රසංග අංකය තරගයෙන් ඉවත් කිරීමට හේතු සාධකයක් වනු ඇත.** <u>මේ පිළිබඳව ඔබගේ දැඩි අවධානය යොමු කරවනු කැමැත්තෙමි.</u>

02.04 පසුබිම් වාදනයෙන් සහාය විය හැක්කේ ප්‍රසංග ඉදිරිපත් කරන විදුහලේ ඉගෙනුම ලබන සිසු/සිසුවියන්ට පමණි. ප්‍රාථමික පාසල්, සිසුන් 500 ට අඩු හා 501 සිට 1000 දක්වා ජාතික හා පළාත් පාසල් වලට මෙය අදාළ නොවේ. සිසුන් 1000 ට වැඩි පළාත් පාසල් හා ජාතික පාසල් ඉදිරිපත් කරන ප්‍රසංග අංක සඳහා වාදනයෙන් සහාය විය හැක්කේ අදාළ පාසලේ ඉගෙනුම ලබන සිසු/ සිසුවියන්ට පමණි. 2012 **වසරේ දී සියලුම පාසල් වාදනය සඳහා තම පාසලේ සිසු සිසුවියන් පමණක් යොදා ගත යුතුය.**

02.06 මිශ්‍ර නැටුම් අංකයන් සඳහා නර්තනයේ දී මෙන්ම ගායනයේ දී ගැහැණු පිරිමි සමාන විම අනිවාර්ය වේ.

02.07 බාලිකා පාසලකට ගැහැණු තරග ශීර්ෂ යටතේ ද, බාලක පාසලකට පිරිමි තරග ශීර්ෂ යටතේ ද, මිශ්‍ර පාසලකට මිශ්‍ර තරග ශීර්ෂ යටතේ ද, ඉදිරිපත් විය යුතුය. එසේ වුවද 1000ට අඩු හා 1000ට වැඩි මිශ්‍ර පාසල් තරග ශීර්ෂ තුනකට (03) ඉදිරිපත් වන්නේ නම්, ඉන් දෙකක් (02) අනිවාර්යයෙන්ම මිශ්‍ර විය යුතු අතර, ඉතිරි තරග ශීර්ෂය විවෘත අංශයෙන් සමූහ - ගැහැණු, සමූහ - පිරිමි, ඒකල - ගැහැණු,ඒකල -පිරිමි තරග ශීර්ෂයකට ඉදිරිපත් විය යුතුය. එසේම තරග ශීර්ෂ දෙකක් (02) සඳහා පමණක් ඉදිරිපත් වන්නේ නම් ඉන් එකක් මිශ්‍ර - සමූහ අංකයක් විය යුතු අතර, අනෙක් තරග ශීර්ෂය සමූහ - ගැහැණු, සමූහ - පිරිමි, ඒකල - ගැහැණු, ඒකල- පිරිමි, තරග ශීර්ෂ යටතේ ඉදිරිපත් විය යුතුය. (විවෘත අංශයේ තරග ශීර්ෂ තෝරා ගත හැක්කේ තරග ශීර්ෂ තුනකට (03) ඉදිරිපත් වන්නේ නම් පමණි.)

02.10 පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව 500ට අඩු නම්, සමූහ හෝ ඒකල තරග ශීර්ෂයකට ඉදිරිපත් වීමට අවසර ඇත.

02.11 මෙම තරගයට 01 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන්ට සහභාගී වීමට හැකි අතර, මෙයට තම විදුහලේ දෙවන වර උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන් ද ඇතුළත් ය. **(එම සිසුන් 1991 ජනවාරි 01 දිනට පසු උපන් අය විය යුතුය.)**

02.12 • 2010 වසරේ දී ඒකල හෝ යුගල තරග ශීර්ෂයකින් සමස්ත ලංකා තරගයේ දී ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ලබා ගත් සිසුවෙකුට හෝ සිසුවියකට මෙම වසරේ දී එම තරග ශීර්ෂය හෝ වෙනත් ඒකල හෝ යුගල තරග ශීර්ෂ යටතේ ඉදිරිපත් වීමට නොහැකි ය. මෙය අනෙක් සමූහ තරග ශීර්ෂයන්ට අදාළ නොවේ.

• එසේම 2010 වසරේදී ඉගිනළු තරග ශීර්ෂයකින් සමස්ත ලංකා තරගයේ දී ප්‍රථම ස්ථානය ලබා ගත් පාසල් වලට මෙම වසරේ දී එම තරග ශීර්ෂයට ඉදිරිපත් වීමට ද නොහැකිය.

## <u>*03. කලාප තරග*</u>

03.03 සියළුම කලාපීය තරග <u>2011 මැයි මස 10</u> වන දිනට පෙර පවත්වා අවසන් කළ යුතුය.

03.04 කලාපීය තරගය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඒ ඒ අධ්‍යාපන කලාපයේ නර්තන හෝ සෞන්දර්ය විෂය භාර නි.අ.අ./ ස.අ.අ./ ගුරු උපදේශකගේ අධීක්ෂණය හා සහාය ඇතිව තෝරාගත් ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ පවත්වා, එහි ප්‍රතිඵල පිටපත් දෙකකින් සකස් කොට 2011.05.15 දිනට පෙර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නර්තන හෝ සෞන්දර්ය විෂය භාර නි.අ.අ./ ස.අ.අ. වරයාට ද, **<u>අනෙක් පිටපත අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත</u> අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය), සෞන්දර්ය ශාඛාව, ඉසුරුපාය, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

## <u>*පළාත් තරග*</u>

03.11 සියළුම පළාත් තරග පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තම පළාතේ සෞන්දර්ය අධ්‍යක්ෂ හෝ නර්තන විෂය භාර අධ්‍යක්ෂවරයාගේ සහාය ඇතිව <u>2011 ජූලි මස 15</u> දිනට පෙර පවත්වා අවසන් කළයුතු වේ.

03.17 පළාත් තරග පවත්වා අදාල ප්‍රතිඵල ලේඛනය <u>2011 ජූලි මස 30</u> වන දිනට පෙර **අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය), සෞන්දර්ය ශාඛාව, ඉසුරුපාය, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුය. ප්‍රථම ස්ථානයන් පමණක් සටහන් කළ එම ප්‍රතිඵල ලේඛනවල පාසලේ නම හා ලිපිනය ද පැහැදිලිව සටහන් කළ යුතු ය.

## <u>*සමස්ත ලංකා තරගය*</u>

03.20 මෙම වර්ෂයේ ජාතික මහා තරගය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ විසින් සංවිධානය කොට <u>2011 ඔක්තෝබර් මස 30</u> දිනට පෙර මඩකලපුව නගර ආශ්‍රිතයේදී පවත්වනු ලැබේ.

## <u>*04. තරගයට ඉදිරිපත් වීම*</u>

04.04 මෙම චක්‍රලේඛය අවසානයේ දී ඇති ආකෘතියට අනුව (ඇමුණුම් අංක 04) අයදුම්පත් පිටපත් දෙකක් පිළියෙල කර එක් පිටපතක් කලාප අධ්‍යාපන කාර්යාලයේ නැටුම් විෂය භාර නි.අ.අ. / ස.අ.අ.වරයාට හෝ ගුරු උපදේශකට ද අනෙක් පිටපත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සෞන්දර්ය විෂය භාර නි.අ.අ./ ස.අ.අ.වරයාට හෝ ගුරු උපදේශකට ද ලැබෙන සේ <u>2011 මාර්තු මස 30</u> දිනට පෙර එවිය යුතුය. **(අදාළ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් තරගය සඳහා වලංගු නොකර ගැනීමට කලාපීය සෞන්දර්ය විෂය භාර අධ්‍යක්ෂවරයා / ගුරු උපදේශක වග බලා ගත යුතු ය.)**

04.10 ඒකල තරග ශීර්ෂ සඳහා ඉදිරිපත් වන ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ නම සඳහන් කිරීමේදී පැහැදිලිවම **එම නම පළමුව** සඳහන් කළ යුතුය. සහායකයින්ගේ නම ඉදිරියෙන් ඔහු/ ඇය සහායකයෙකු බව සඳහන් කළ යුතුය.

## 05. සහභාගී විය හැකි සංඛ්‍යාවන්

05.01 යම් තරග ශීර්ෂයකට සහභාගී විය හැකි තරගකරුවන්ගේ උපරිම හා අවම සංඛ්‍යාවන් පහත දක්වා ඇත.

- ප්‍රාථමික - අවමය 06කි. උපරිමය 16කි. ගායනය හා වාදනය සඳහා 08 දෙනෙකුට සහභාගිවිය හැක. (උපරිම සම්පූර්ණ සංඛ්‍යාව 24කි.)
- ඒකල - උපරිමය 05 කි. (ගායනය, වාදනය ද ඇතුළුව)
- යුගල - උපරිමය 04 කි.
- සමූහ - (ගැහැණු / පිරිමි / මිශ්‍ර) අවමය 06කි. උපරිමය 16කි. ගායනය හා වාදන සඳහා 08 දෙනෙකුට සහභාගීවිය හැක. මිශ්‍ර අංක සඳහා නර්තනයට හා ගායනයට සහභාගි වන සංඛ්‍යාව සමාන විය යුතු අතර වාදන සඳහා සහභාගී වන සංඛ්‍යාව සමාන වීම අවශ්‍ය නැත. (උපරිම සම්පූර්ණ සංඛ්‍යාව 24කි.)
- ඉහි නළු - අවමය 06කි. උපරිමය 16කි. වාද්‍ය වෘන්දය සඳහා 08 දෙනෙකුට සහභාගිවිය හැක. (උපරිම සම්පූර්ණ සංඛ්‍යාව 24කි.)

05.02 තරග අවස්ථාවේ දී සහාය වාදනයන් සඳහා එම අංගය **පුහුණු කළ ගුරු භවතාට අවසර දී තිබේ නම්** ඔහු ද / ඇය ද, සහභාගී වන තරගකරුවන්ගේ සංඛ්‍යාවෙහි ලා සලකනු ලැබේ. සිසුන් 1000 ට වැඩි කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ, විවෘත තරග ශීර්ෂ වලදී **ප්‍රසංග අංගය පුහුණු කළ ගුරු භවතාට විනිශ්චය මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීම සපුරා තහනම් වේ.** මෙය දරුවන්ගේ තරගයක් ලෙස සලකා සියලු කටයුතු ඔවුන්ට ඉටු කර ගැනීමට අවස්ථාව සලසා දිය යුතුය.

05.03 තරගකරුවන් සංඛ්‍යාව ලෙස මෙහි ලා සලකනු ලබන්නේ, විනිශ්චය මණ්ඩලය අභිමුවෙහි ප්‍රසංග අංකය ඉදිරිපත් කරන මොහොතෙහි දී ඒ සඳහා සහභාගී වන සංඛ්‍යාවය.

## 06. තරගය සඳහා යොදා ගන්නා ඇඳුම්

**(ජාතික මහා තරගය සඳහා ඉදිරිපත් වන පාසල්, ඇඳුම් නිර්මාණය කිරීමේදී දරුවන්ට හා දෙමව්පියන්ට නොයෙක් ආකාරයෙන් බලපෑම් කරන බවට තොරතුරු ලිඛිතව මා වෙත යොමු කොට ඇති බැවින් මේ පිළිබඳව විදුහල්පති වරුන්ගේ හා නර්තන විෂය භාර ගුරු භවතුන්ගේ දැඩි අවධානය යොමු කරන අතර ඉදිරියේ එවැනි අවස්ථාවක් උදා වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ)**

06.01 කලාප, පළාත් තරග වටයන් සඳහා ප්‍රසංග අංක වලට ඉදිරිපත් කරන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් පුහුණු ඇඳුම් කට්ටලයෙන් සැරසී තරගයට ඉදිරිපත් වීම ප්‍රමාණවත් වේ. **(ඇමුණුම 01 බලන්න)** මෙහිදී,

- ශිෂ්‍යාවන් - දිග මේස් කලිසම, කොට සාය, අත් සමග හැට්ටය (දිග අත් නොවේ). තනි කරලට ගොතන ලද කොණ්ඩය (කොට සාය වෙනුවට රෙදි දවටා නොගත යුතුය). ලියෝ ගාඩ් භාවිතා කිරීම සපුරා තහනම් වේ.
- ශිෂ්‍යයන් - දිග මේස් කලිසම, ටී ෂර්ටයක් හෝ අත්දිග මේස් බැනියමක් (මේස් කලිසමට මතුපිටින් දණහිස දක්වා දිග රෙදි කඩක් ඇඳිය යුතු අතර වෙනත් ඇඳුම් භාවිතා නොකළ යුතුය.)

06.02 කලාප / පළාත් තරගයේ දී, වෙස් ගැන්වීම සහ ආභරණ පැළඳීම අවශ්‍ය නොවුව ද, ශාස්ත්‍රීය නැටුම් වල දී සිලම්බු හෝ ගෙජ්ජි භාවිතා කල හැකිය.

06.03 ජාතික මහා තරගයේ දී කනිෂ්ඨ අංශයේ කිසිදු තරගකරුවෙක් කිසිදු නර්තන අංගයක් සඳහා වෙස් ආභරණ කට්ටල පැළඳවීම නො කළ යුතු ය. ඒ සඳහා නෛයඩ් ඇඳුම් කට්ටලය ප්‍රමාණවත් වේ.

06.04 ජාතික තරගයේදී 1000ට වැඩි පාසල් වලින් ඉදිරිපත් කරන සියලුම ප්‍රසංග අංක වලට හා 1000ට අඩු පාසල් තරග ශිර්ෂ03.08-පහතරට නාගකන්‍යා/නාග රාක්ෂ,03.13-ජන නැටුම් නිර්මාණ,04.04- නිර්මාණ වන්නම්,04.06-ඉහිනළු,යන ශීර්ෂ යටතේ දක්වා ඇති ප්‍රසංග අංක සඳහා පමණක් ගැලපෙන ඇඳුමින් සැරසී ප්‍රසංග අංක ඉදිරිපත් කළ යුතුය. **(හැකි සෑම විටකම මේ සඳහා සරල ඇඳුම් යොදා ගැනීම වැදගත්ය.)**

- **500 ට අඩු හා 1000ට අඩු පාසල් චක්‍රලේඛයේ දක්වා ඇති අනෙක් සියලුම ප්‍රසංග අංක සඳහා ජාතික මහා තරගයේදී ද පුහුණු ඇඳුම් කට්ටලයෙන් සැරසී ප්‍රසංග අංකය ඉදිරිපත් කළ යුතුය.**

06.07 තරග අවස්ථාවේ දී තම පාසලේ අනන්‍යතාවය හෙළි වන ආකාරයේ ඇඳුම් පැළඳුම් භාවිතා නො කළ යුතු ය.(පාසල් නිල ඇඳුම, පාසලේ නම ඇතුලත් යම් යම් සාධක ආදී)

06.08 නිර්මාණ නැටුම් තරග ශීර්ෂයන්හි දී සිසු සිසුවියන් සැරසී සිටින ඇඳුම් පැළඳුම්, පාසල් පද්ධතියට දේශීය භර පද්ධතීන්ට ගැලපෙන සහ එම සිසු-සිසුවියන්ගේ ආත්ම ගෞරවය සුරැකෙන හා සංවරශීලී ඒවා විය යුතුය. අනවශ්‍ය ආකාරයෙන් අඟ පසඟ නිරාවරණය නොවන ලෙසට ඒවා නිර්මාණය වී තිබිය යුතු ය. ඉහත කරුණු පිළිබඳ පූර්ණ වගකීම, අදාල විදුහලේ විදුහල්පති හා විෂය භාර / කණ්ඩායම් භාර ගුරු භවතුන් සතු වේ. සදාචාරයට පටහැනි ඇඳුම් නිර්මාණය තරගයෙන් ඉවත් කිරීමට හේතුවක් වනු ඇත. (විශේෂයෙන්ම ශිෂ්‍යාවන්ගේ ශික්ෂණයට හානි වන අයුරින් ඇඳුම් ඇන්දවීම සපුරා තහනම් වේ.)

06. 09 උඩරට, පහතරට, සබරගමු, ශාස්ත්‍රීය නර්තන අංග වලදී සාම්ප්‍රදායික වර්ණ(සුදු,රතු,කහ)භාවිතය අනිවාර්ය වේ.

## 09 කණ්ඩායම් භාරකාරත්වය සහ වෙනත් කොන්දේසි

09. 02 කිසිදු තරග වටයක දී දෙමව්පියන් හෝ සුභ පතන්නන් කැඳවාගෙන නො ආයුතුය. කිසිදු දෙමව්පියෙකුට හෝ සුභ පතන්නෙකුට තරග පවත්වන මධ්‍යස්ථාන වලට ඇතුල්වීමට අවස්ථාව දෙනු නොලැබේ. එසේ තරග මධ්‍යස්ථාන වලට බලහත්කාරයෙන් පැමිණ තරගකරුවන්ට අවහිර වන ආකාරයෙන් හෝ විනිශ්චය මණ්ඩලයට හෝ සංවිධායක මණ්ඩලයට කිසියම් බලපෑමක් කළහොත්, ඒ පිළිබඳ නර්තන විෂයභාර ගුරුභවතා හා විදුහල්පති වගවියයුතු අතර, ඔබ විදුහලේ ප්‍රසංග අංකය තරගයෙන් ඉවත් කිරීමට සිදුවනු ඇත. **මේ පිළිබඳව දැඩි සේ ඔබගේ අවධානය යොමු කරවමි. මෙය කලාප/පළාත් තරග වලදී ද වලංගු වේ.**

09.06 කිසිදු තරගවටයක දී වේදිකා සැරසිලි (අයිල, තොරන්, යහන්, මල්, පැල් වැනි දෑ හෝ වෙනත් කිසිදු සැරසිල්ලක් ) ඉදිරිපත් නොකළ යුතුය. මෙය ශාස්ත්‍රීය නැටුම්, ගැමි නැටුම්, ගැමි නැටුම් නිර්මාණ වල දී වලංගු වේ.

# තරග ශීර්ෂ

## තරග ශීර්ෂ තෝරා ගැනීම.

1. ශාස්ත්‍රීය නැටුම් උඩරට/ පහතරට/ සබරගමු යන සම්ප්‍රදායන් තුනෙන් එකම සම්ප්‍රදායක් යටතේ තෝරා ගත හැක්කේ එක් ප්‍රසංග අංගයක් පමණි.

11. ගැමි නැටුම් හා ගැමි නැටුම් නිර්මාණ ප්‍රසංග අංග දෙකෙන් තෝරා ගත හැක්කේ එක් ප්‍රසංග අංගයක් පමණි.

111. සමූහ බෙර වාදන, යුගල, ඒකල බෙර වාදන ප්‍රසංග අංග තුනෙන් තෝරා ගත හැක්කේ එක් ප්‍රසංග අංගයක් පමණි.

### 01. ප්‍රාථමික අංශය (1-5 ශ්‍රේණි)

**1. 1 නර්තන නිර්මාණ (1, 2, 3, 4, 5 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

| | | |
|---|---|---|
| 1. 1 .1 | **ප්‍රාථමික / සමූහ /ගැහැණු /** | **ලේන්සු හැංගීම** |
| 1. 1. 2 | **ප්‍රාථමික / සමූහ /පිරිමි /** | **පොල්පිති හරකා ඇසුරින්** |
| 1. 1. 3 | **ප්‍රාථමික / සමූහ /මිශ්‍ර /** | **කුරුම්බැට්ටි මැෂිම හා පොල්කොල රූනා ඇසුරින්** |

- තරග ශීර්ෂයට අදාළ රංග භාණ්ඩ පමණක් භාවිතය ඇසුරෙන් සකස් කළ නිර්මාණාත්මක නර්තනයක් විය යුතු ය. බටහිර චලන යොදා ගැනීම සපුරා තහනම්ය.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 06කි.
- යොදාගත හැකි වාද්‍ය භාණ්ඩ: තාල වාද්‍ය භාණ්ඩ වලට අමතරව සර්පිනාව, බටනලාව හා ආදේශ භාණ්ඩ යොදාගත හැක.
- විද්‍යුත් සංගීත භාණ්ඩ හා බටහිර සංගීත භාණ්ඩ භාවිතා කල නොහැක.

× **සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සඳහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

### 02. කනිෂ්ඨ අංශය (6-8 ශ්‍රේණි)

**2. 1 කෙළි නැටුම් (6, 7, 8 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

| | | |
|---|---|---|
| 2. 1. 1. | **කනිෂ්ඨ / සමූහ /ගැහැණු /** | **ඔළිඳ කෙළිය** |
| 2. 1. 2. | **කනිෂ්ඨ / සමූහ /පිරිමි /** | **චක්ගුඩු** |
| 2. 1. 3. | **කනිෂ්ඨ / සමූහ /මිශ්‍ර /** | **අංකෙළිය** |

- නිර්මාණාත්මක ගැමි නර්තනයක් විය යුතු ය. (රංග භාණ්ඩ පමණක් යොදා ගත හැකිය.)
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 06කි.
- යොදාගත හැකි වාද්‍ය භාණ්ඩ: තාල වාද්‍ය භාණ්ඩ වලට අමතරව සර්පිනාව, බටනලාව, ආදේශ භාණ්ඩ යොදාගත හැක. විද්‍යුත් සංගීත භාණ්ඩ හා බටහිර සංගීත භාණ්ඩ භාවිතා කල නොහැක.

× **සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සඳහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

**2. 2 උඩරට (7, 8, 9 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

| | | |
|---|---|---|
| 2. 2. 1. | **කනිෂ්ඨ / සමූහ / උඩරට / ගැහැණු /** | **වෛරොඩි වන්නම (මාත්‍රා 3 තනි තිත)** |
| 2. 2. 2. | **කනිෂ්ඨ / සමූහ / උඩරට / පිරිමි /** | **සිංහරාජ වන්නම (මාත්‍රා 4 තනි තිත)** |
| 2. 2. 3. | **කනිෂ්ඨ / සමූහ / උඩරට / මිශ්‍ර /** | **මංගලම් (මාත්‍රා 2 + 2 + 2 + 4 + 4 - පස් තිත)** |

- සම්පූර්ණ වන්නම අදාල තිත් රූපයට නටා ඊට අයත් නියමිත කස්තිරම, සීරු මාරුව හා අඩව්ව නැටීමෙන් අවසන් කළ යුතු අතර මංගලම් කස්තිරම නැටීමෙන් අවසන් කළ යුතුය.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 06කි.
- ගැටබෙරය සහ තාලම්පට පමණක් වාදනය කල යුතුය.

× **සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සඳහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

**2. 3. පහතරට (7, 8, 9 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

2. 3. 1. **කනිෂ්ඨ / සමූහ / පහතරට / ගැහැණු / ශුද්ධ තාලය සින්දු වන්නම (මාත්‍රා 2 + 2 + 3**

2. 3. 2. **කනිෂ්ඨ / සමූහ / පහතරට / පිරිමි / කොන්ඩකාලිංචි තාලය සින්දු වන්නම(මාත්‍රා 2+2+4 )**

2. 3. 3. **කනිෂ්ඨ / සමූහ / පහතරට / මිශ්‍ර / නාථ මල් අස්න**

- සින්දු වන්නමට අදාළ බෙර පදය, තානම, කවිය හා ඉරට්ටය යන සියලුම අංග ඇතුලත් විය යුතුය.
- වන්නමෙහි සාම්ප්‍රදායික ලක්ෂණයන්ට හානි නොවන පරිදි පද ගුණකර නැටීමට හා මූල පදය අලංකාර කර ඒ අනුව නැටීමට ද අවකාශ ඇත.
- මල් අස්න ශ්ලෝක, කෙටි කවි හා අදාළ අනෙක් කවි ගායනා කරමින් නටා ඊට නියමිත ඉරට්ටිය නැටීමෙන් අවසන් කල යුතුය.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 06කි.
- පහතරට බෙරය සහ (අවශ්‍ය නම් පමණක්) තාලම්පට වාදනය කල හැකිය.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සඳහා 08 කි.**

**(සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

**2. 4. සබරගමු (7, 8, 9 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

2. 4. 1. **කනිෂ්ඨ / සමූහ /සබරගමු / ගැහැණු / මුල් මාත්‍රය**

2. 4. 2. **කනිෂ්ඨ / සමූහ / සබරගමු / පිරිමි / සින්දු මාත්‍රය**

2. 4. 3. **කනිෂ්ඨ / සමූහ / සබරගමු / මිශ්‍ර / පට්ටුකල් මාත්‍රය**

- සම්පූර්ණ මාත්‍රය අදාල තිත් රූපයට නටා ඊට නියමිත කලාසම, අඩව්ව නැටීමෙන් අවසන් කල යුතුය. කලාසම, අඩව්ව, වට්ටම් වලදී කඩිප්පු භාවිතය අනිවාර්ය වේ. (වට්ටම් අවශ්‍ය නැත)
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 06කි.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සඳහා 08 කි.**

**(සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

**2. 5. උඩරට (6,7,8, 9 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

2. 5. 1. **කනිෂ්ඨ / ඒකල / උඩරට /ගැහැණු / ගණපති වන්නම (මාත්‍රා 3 තනි තිත)**

2. 5. 2. **කනිෂ්ඨ / ඒකල / උඩරට / පිරිමි / උදාර වන්නම (මාත්‍රා 3 තනි තිත විලම්භ ලය)**

- සම්පූර්ණ වන්නම අදාල තිත් රූපයට නටා ඊට නියමිත කස්තිරම, සීරු මාරුව හා අඩව්ව නැටීමෙන් අවසන් කළ යුතුය.
- ගැටබෙරය සහ තාලම්පට පමණක් වාදනය කල හැක.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 06කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි. ගායනය හා වාදනය ද සහිතව.**

**2. 6. පහතරට (6,7,8, 9 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

2. 6. 1. **කනිෂ්ඨ / ඒකල / පහතරට / ගැහැණු / සරල කවි තාල**
**(මාත්‍රා 2 තනිතිත හා මාත්‍රා 2+4 හා මාත්‍රා 3+4 දෙතිත තාලරූප ඇසුරින් )**

2. 6. 2. **කනිෂ්ඨ / ඒකල / පහතරට / පිරිමි / සරල කවි තාල**
**(මාත්‍රා 3 තනිතිත හා මාත්‍රා 2+3 හා මාත්‍රා 3+4 දෙතිත තාලරූප ඇසුරින් )**

- අදාල තිත් රූපයට නටා ඊට නියමිත ඉරට්ටි නැටීමෙන් අවසන් කළ යුතුය. සාම්ප්‍රදායික ලක්ෂණයන්ට හානි නොවන පරිදි පද ගුණකර නැටීමට හා මූල පදය අලංකාර කර ඒ අනුව නැටීමට අවකාශ ඇත.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 06කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි. ගායනය හා වාදනය සහිතව.**

**2. 7. සබරගමු (6,7,8, 9 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

2. 7. 1. **කනිෂ්ඨ / ඒකල / සබරගමු /ගැහැණු / කොවුලා වන්නම (මාත්‍රා3 +4 හා 3 තිත් රූපයට )**

2. 7. 2. **කනිෂ්ඨ / ඒකල / සබරගමු / පිරිමි / මණ්ඩුක වන්නම (මාත්‍රා 3 + 4 දෙතිත)**

- සම්පූර්ණ වන්නම අදාල තිත් රූපයට නටා ඊට නියමිත කලාසම, අඩව්ව, වාදනයේදී කඩිප්පු භාවිත කිරීම අනිවාර්ය වේ. වට්ටම නැටීම අවශ්‍ය නැත.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 06කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි. ගායනය හා වාදනය සහිතව.**

03. ජ්‍යෙෂ්ඨ අංශය (10-13 ශ්‍රේණි)

**3. 1 උඩරට නර්තනය (10, 11 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

3. 1. 1. **ජ්‍යෙෂ්ඨ / ඒකල / උඩරට /ගැහැණු /** **බුලත් පදය**

3. 1. 2. **ජ්‍යෙෂ්ඨ / ඒකල / උඩරට / පිරිමි /** **පොල් පදය**

- ඉහත නර්තන අංග ඇසුරෙන් ශාස්ත්‍රීය බව ආරක්ෂා වන පරිදි ප්‍රාසාංගික අංගයක් අපේක්ෂා කෙරේ.
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි. වාදනය සහිතව.**

**3. 2 පහතරට නර්තනය (10, 11 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

3. 2. 1. **ජ්‍යෙෂ්ඨ / ඒකල / පහතරට / ගැහැණු /** **සළු පදය**

3. 2. 2. **ජ්‍යෙෂ්ඨ / ඒකල / පහතරට / පිරිමි /** **දුම්මල පදය**

- ඉහත නර්තන අංග ඇසුරෙන් ශාස්ත්‍රීය බව ආරක්ෂා වන පරිදි ප්‍රාසාංගික අංගයක් අපේක්ෂා කෙරේ.
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි. ගායනය හා වාදනය සහිතව.**

**3. 3 සබරගමු (10, 11 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

3. 3. 1. **ජ්‍යෙෂ්ඨ / ඒකල / සබරගමු /ගැහැණු /** **තැඹිලි පාලිය**

3. 3. 2. **ජ්‍යෙෂ්ඨ / ඒකල / සබරගමු / පිරිමි /** **කලස් පාලිය**

- ඉහත නර්තන අංග ඇසුරෙන් ශාස්ත්‍රීය බව ආරක්ෂා වන පරිදි ප්‍රාසාංගික අංගයක් අපේක්ෂා කෙරේ.
- ගායනයේ දී කඩිප්පු භාවිතා නො කළ යුතු ය. කලාසම, අඩව්ව වාදනයේදී කඩිප්පුව භාවිතා කිරීම අනිවාර්‍ය වේ.
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි. ගායනය හා වාදනය සහිතව.**

**3. 4 ජ්‍යෙෂ්ඨ - ඒකල - බෙරවාදනය - උඩරට (10, 11 ශ්‍රේණි සඳහා)** 500ට අඩු/ 501-1000/1000ට වැඩි

3. 4. 1. **ජ්‍යෙෂ්ඨ / ඒකල / උඩරට /ගැහැණු /** **බෙර වාදනය**

3. 4. 2. **ජ්‍යෙෂ්ඨ / ඒකල / උඩරට / පිරිමි /** **බෙර වාදනය**

- ශාස්ත්‍රීය පද කොටස් පිළිබඳ අවධානය යොමු කරමින් තනිතිත, දෙතිත, තුන්තිත යන තාලරූප අනුව බලි ශාන්ති කර්මය හා බැඳි ගායනා කරමින් මූලික පද, අලංකාර පද හා අදාළ තිත් රූපයට අනුව කස්තිරම් ද වාදනය කිරීම අපේක්ෂා කෙරේ.
- වාදනයට උචිත සරල චලන හා රංගරටා(වාදනයට හානියක් නොවන සේ භාවිතා කළ හැකිය.)
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.**

**3. 5 ජ්‍යෙෂ්ඨ - ඒකල - බෙරවාදනය - පහතරට (10, 11 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

3. 5. 1. **ජ්‍යෙෂ්ඨ / ඒකල / උඩරට /ගැහැණු /** **බෙර වාදනය**

3. 5. 2. **ජ්‍යෙෂ්ඨ / ඒකල / උඩරට / පිරිමි /** **බෙර වාදනය**

- ශාස්ත්‍රීය පද කොටස් පිළිබඳ අවධානය යොමු කරමින් තනිතිත, දෙතිත, තුන්තිත යන තාලරූප අනුව බලි ශාන්ති කර්මය හා බැඳි ගායනා කරමින් මූලික පද, අලංකාර පද හා අදාළ තිත් රූපයට අනුව ඉරට්ටි ද වාදනය කිරීම අපේක්ෂා කෙරේ.
- වාදනයට උචිත සරල චලන හා රංගරටා(වාදනයට හානියක් නොවන සේ භාවිතා කළ හැකිය.)
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි. වාදනය සමග**

**3. 6 ජ්‍යෙෂ්ඨ - ඒකල - දවුල් වාදනය - සබරගමු (10, 11 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

3. 6. 1. **ජ්‍යෙෂ්ඨ / ඒකල / උඩරට /ගැහැණු /** **දවුල් වාදනය**

3. 6. 2. **ජ්‍යෙෂ්ඨ / ඒකල / උඩරට / පිරිමි /** **දවුල් වාදනය**

- ශාස්ත්‍රීය පද කොටස් පිළිබඳ අවධානය යොමු කරමින් තනිතිත, දෙතිත, තුන්තිත යන තාලරූප අනුව බලි ශාන්ති කර්මය හා බැඳි ගායනා කරමින් මූලික පද, අලංකාර පද හා අදාළ තිත් රූපයට අනුව කලාසම ද වාදනය කිරීම අපේක්ෂා කෙරේ. කලාසම් වාදනයේ දී කඩිප්පුව භාවිතා කිරීම අනිවාර්ය වේ.
- වාදනයට උචිත සරල චලන හා රංගරටා(වාදනයට හානියක් නොවන සේ භාවිතා කළ හැකිය.)
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි. වාදනය සමග**

**3. 7 උඩරට නර්තනය (12. 13 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000 / 1000 ට වැඩි

3. 7. 1. **ජ්‍යෙෂ්ඨ / ඒකල / උඩරට /ගැහැණු / වට්ටම් ඇසුරින්**

**(ගොග් ගොග් ජිං ජිංගත වට්ටමේ සිට දොහර ජිංත තත් ගජිංත වට්ටම දක්වා මූලික පද, අලංකාර පද, කස්තිරම්, අඩව් සහිතව ශාස්ත්‍රීය පද කොටස් පිළිබඳ අවධානය යොමු කරමින් ශාස්ත්‍රීය බව ආරක්ෂා වන පරිදි ප්‍රාසාංගික අංගයක් අපේක්ෂා කෙරේ. )**

3. 7. 2. **ජ්‍යෙෂ්ඨ / ඒකල / උඩරට / පිරිමි / දූනු මාලප්පුව**

- ශාස්ත්‍රීය පද කොටස් පිළිබඳ අවධානය යොමු කරමින් අදාල පද සමග ආරම්භයේ සිට අවසානය දක්වා ඉදිරිපත් කළ යුතු ය.
- ගැට බෙරය හා තාලම්පට පමණක් යොදා ගත හැකිය.
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.**

**3. 8 පහතරට නර්තනය (12. 13 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000/ 1000 ට වැඩි

3. 8. 1. **ජ්‍යෙෂ්ඨ / ඒකල / පහතරට / ගැහැණු / නාග කන්‍යා**

3. 8. 2. **ජ්‍යෙෂ්ඨ / ඒකල / පහතරට / පිරිමි / නාග රාක්ෂ**

- මුහුණු භාවිතය අනිවාර්ය වේ. කෘතිම මුහුණු පැළඳවීම සපුරා තහනම්ය.
- සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් එකී ව්‍යුහයට අනුව නිර්මාණය කළ ප්‍රසාංගික නර්තන අංගයක් අපේක්ෂා කෙරේ.
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි. ගායනය හා වාදනය සහිතව.**

**3. 9 සබරගමු නර්තනය (12. 13 ශ්‍රේණි සඳහා)** 500 ට අඩු/ 501 - 1000/ 1000 ට වැඩි

3. 9. 1. **ජ්‍යෙෂ්ඨ / ඒකල / සබරගමු /ගැහැණු / මුදුන් තාලය**

3. 9. 2. **ජ්‍යෙෂ්ඨ / ඒකල / සබරගමු / පිරිමි / දේව කෝල්පාඩුව**

- ශාස්ත්‍රීය පද කොටස් පිළිබඳ අවධානය යොමු කරමින් අදාල පද සමග ආරම්භයේ සිට අවසානය දක්වා ඉදිරිපත් කළ යුතු ය.
- කලාසම, අඩව්ව භාවිතයේදී කඩිප්පුව භාවිතා කිරීම අනිවාර්ය වේ.
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07 කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි. ගායනය හා වාදනය සහිතව.**

**3. 10 උඩරට නර්තනය (10, 11, 12. 13 ශ්‍රේණි සඳහා)** 501 - 1000/ 1000 ට වැඩි

3. 10. 1. **ජ්‍යෙෂ්ඨ / සමූහ / උඩරට /ගැහැණු / අස්නේ**
(මූලික පද හා අලංකාර පද හා කස්තිරම් සහිතව ආරම්භයේ සිට අවසානය දක්වා)

3. 10. 2. **ජ්‍යෙෂ්ඨ / සමූහ / උඩරට / පිරිමි / උඩැක්කි අස්නේ**
(ආශීර්වාද කවි, මූලික පද, අලංකාර පද, වට්ටම් පද සහිතව ආරම්භයේ සිට අවසානය දක්වා ගායනා සහිතව,)

3. 10. 3. **ජ්‍යෙෂ්ඨ / සමූහ / උඩරට / මිශ්‍ර / කොහොඹා හැල්ල**
(කෙටි කවි, කවි ගායනය සමග ආරම්භයේ සිට අවසානය දක්වා තිත් මාත්‍රාද සහිතව)

- 3. 10. 2 වාදනය සඳහා උඩැක්කි පමණක් භාවිතා කළ යුතුය.
- ගැටබෙර හා තාලම්පට පමණක් යොදාගත යුතුය.
- කාලය: අවම විනාඩි 06කි. උපරිම විනාඩි 08කි.
- සාම්ප්‍රදායික බව ගැඹුරින් අධ්‍යයනය කොට මෙම නිර්මාණය ඉදිරිපත් කල යුතුය.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සඳහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

**3. 11 පහතරට නර්තනය (10, 11, 12. 13 ශ්‍රේණි සඳහා)** 501 - 1000/ 1000 ට වැඩි

3. 11. 1. **ජ්‍යෙෂ්ඨ / සමූහ / පහතරට / ගැහැණු / ගිරිදේවි**

3. 11. 2. **ජ්‍යෙෂ්ඨ / සමූහ / පහතරට / පිරිමි / දෙවොල්**

3. 11. 3. **ජ්‍යෙෂ්ඨ / සමූහ / පහතරට / මිශ්‍ර / යහන් දැක්ම**

- සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් එකී ව්‍යුහයට අනුව නිර්මාණය කළ ප්‍රසාංගික නර්තන අංගයක් අපේක්ෂා කෙරේ.
- කාලය: අවම විනාඩි 06කි. උපරිම විනාඩි 08කි.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සඳහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

| 3. 12 | සබරගමු නර්තනය (10, 11, 12. 13 ශ්‍රේණි සඳහා) | 501 - 1000/ 1000 ට වැඩි |
|---|---|---|

3. 12. 1. **ජ්‍යෙෂ්ඨ / සමූහ / සබරගමු /ගැහැණු /** **සළු පදය**

3. 12. 2. **ජ්‍යෙෂ්ඨ / සමූහ / සබරගමු / පිරිමි /** **පන්දම් පද** (පන්දම් නොදල්වා භාවිතා කළ හැකිය)

3. 12. 3. **ජ්‍යෙෂ්ඨ / සමූහ / සබරගමු / මිශ්‍ර /** **මල් පදය** (වට්ටම් පිරිම හා ගායනා සහිතව)

- සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් එකී ව්‍යුහයට අනුව නිර්මාණය කළ ප්‍රාසාංගික නර්තන අංගයක් අපේක්ෂා කෙරේ.
- කාලය: අවම විනාඩි 06කි. උපරිම විනාඩි 08කි.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සදහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

| 3. 13 | ජන නැටුම් නිර්මාණ (10, 11, 12. 13 ශ්‍රේණි සඳහා) | 501 - 1000/ 1000 ට වැඩි |
|---|---|---|

3. 13. 1. **ජ්‍යෙෂ්ඨ / සමූහ / ජන නැටුම් නිර්මාණ /ගැහැණු / කොහු කර්මාන්තය**

**(කොහු කර්මාන්තය ඇසුරින් කල නිර්මාණයක් විය යුතුය)**

3. 13. 2. **ජ්‍යෙෂ්ඨ / සමූහ / ජන නැටුම් නිර්මාණ / පිරිමි /** **වඩු කර්මාන්තය**

**( කොහු කර්මාන්තය ඇසුරින් කල නිර්මාණයක් විය යුතුය)**

3. 13. 3. **ජ්‍යෙෂ්ඨ / සමූහ / ජන නැටුම් නිර්මාණ / මිශ්‍ර /** **කුරුඳු කර්මාන්තය**

**(කුරුඳු කර්මාන්තය ඇසුරින් කළ නිර්මාණයක් විය යුතුය.)**

- නිර්මාණයට උචිත පරිදි එක් රංග උපකරණයක් පමණක් භාවිතා කරමින් නිර්මාණාත්මක ජන නැටුමක් විය යුතු ය.
- නාට්‍යමය ලක්ෂණ වලින් සම්පූර්ණයෙන් බැහැර විය යුතුය. සාමූහික බව, එමකම, සරල බව ආරක්ෂා විය යුතුය. විද්‍යුත් හා බටහිර වාද්‍ය භාණ්ඩ හැර වෙනත් ඕනෑම ආදේශ භාණ්ඩයක් භාවිතා කළ හැකිය.
- කාලය: අවම විනාඩි 06කි. උපරිම විනාඩි 08කි.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සදහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

| 3. 14 | අත්‍යා බෙර වාදන (10, 11, 12. 13 ශ්‍රේණි සඳහා) | 501 - 1000/ 1000 ට වැඩි |
|---|---|---|

3. 14. 1. **ජ්‍යෙෂ්ඨ / යුගල /ගැහැණු /** **අත්‍යා බෙර**

3. 14. 2. **ජ්‍යෙෂ්ඨ / යුගල /පිරිමි /** **අත්‍යා බෙර**

- වට්ටම් පිරිම හා වට්ටම් ඇරීම දක්වා පැහැදිලිව වාදනය කරමින් අවම වශයෙන් වට්ටම් තුනකින් තාල රූප තුනක් වත් වාදනය කළ යුතු ය.
- මූලික පදය හා අලංකාර පදය, හමාර පදය පැහැදිලිව වාදනය විය යුතුය.
- සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 4කි. (බෙර දෙකක් හා තාලම්පට දෙකක්)
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07කි.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 04 කි.**

| 3. 15 | සමූහ බෙර සංධ්වනිය (10, 11, 12. 13 ශ්‍රේණි සඳහා) | 501 - 1000/ 1000 ට වැඩි |
|---|---|---|

3. 15. 1. **ජ්‍යෙෂ්ඨ / සමූහ / බෙර සංධ්වනිය /ගැහැණු**

3. 15. 2. **ජ්‍යෙෂ්ඨ / සමූහ / බෙර සංධ්වනිය / පිරිමි**

3. 15. 3. **ජ්‍යෙෂ්ඨ / සමූහ / බෙර සංධ්වනිය / මිශ්‍ර**

} **දළදා පෙරහැර**

- මෙම ඉසව්ව තෝරා ගන්නා පාසල් වලට ඉදිරිපත් විය හැක්කේ ගැහැණු, පිරිමි, මිශ්‍ර යන අංශ වලින් එක් අංශයකට පමණි.
- අදාළ තේමාව අනුරින් නිර්මාණය කළ යුතුය.
- වාදනය පමණක් අපේක්ෂිතය.
- වාදනයට උචිත සරල චලන හා රංගරටා (වාදනයට හානියක් නොවන සේ) භාවිතා කළ හැකිය.
- පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වලට අමතරව දවුල බෙරය හා ආදේශක භාණ්ඩ යොදාගත හැකිය.
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 16 කි.**

04. විවෘත අංශය (01-13 ශ්‍රේණි)

| 4. 1 බෙර වාදන / උඩරට (10, 11, 12, 13 ශ්‍රේණි සඳහා) | 501 - 1000/ 1000 ට වැඩි |
|---|---|

4. 1. 1. **විවෘත / ඒකල / බෙර වාදන / උඩරට / ගැහැණු /** **මංගල බෙර වාදනය**

4. 1. 2. **විවෘත / ඒකල / බෙර වාදන / උඩරට / පිරිමි /** **මංගල බෙර වාදනය**

- වට්ටම් හතරේ කොටස් ඇසුරෙන් වාදනය කළ යුතු ය.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 06කි.
- එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ මෙම ඉසව් 02කින් එකකට පමණි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.**

| 4. 2 බෙර වාදන / පහතරට (10, 11, 12, 13ශ්‍රේණි සඳහා) | 501 - 1000/ 1000 ට වැඩි |
|---|---|

4. 2. 1. **විවෘත / ඒකල / බෙර වාදන / පහතරට / ගැහැණු /** **මංගල බෙර වාදනය**

4. 2. 2. **විවෘත / ඒකල / බෙර වාදන / පහතරට / පිරිමි /** **මංගල බෙර වාදනය**

- වට්ටම් තුනේ කොටස් ඇසුරින් වාදනය කළ යුතුය.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 06කි.
- එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ මෙම ඉසව් 02කින් එකකට පමණි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.**

| 4. 3 දවුල් වාදන / සබරගමු (10, 11, 12, 13ශ්‍රේණි සඳහා) | 501 - 1000/ 1000 ට වැඩි |
|---|---|

4. 3. 1. **විවෘත / ඒකල / දවුල් වාදන / සබරගමු /ගැහැණු /** **මංගල දවුල් වාදනය**

4. 3. 2. **විවෘත / ඒකල / දවුල් වාදන / සබරගමු / පිරිමි /** **මංගල දවුල් වාදනය**

- කඩිප්පුව භාවිතා කළ යුතු ය.
- කාලය: අවම විනාඩි 04කි. උපරිම විනාඩි 06කි.
- එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ මෙම ඉසව් 02කින් එකකට පමණි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.**

| 4. 4 නිර්මාණ වන්නම් (10, 11, 12, 13 ශ්‍රේණි සඳහා) | 501 - 1000/ 1000 ට වැඩි |
|---|---|

4. 4. 1. **විවෘත / සමූහ / නිර්මාණ වන්නම් /ගැහැණු / මයුරා වන්නම**

4. 4. 2. **විවෘත / සමූහ / නිර්මාණ වන්නම් / පිරිමි /** **හනුමා වන්නම (ඇමුණුම 02 බලන්න)**

**(මාත්‍රා 3+4 දෙකිත හා මාත්‍රා 3 තනි තිතට අයත්ය - තත්ත තනත්තනෙ තාත්ත තනාත්තනෙනා//)**

**(පාසල් පද්ධතිය තුළ භාවිතා වන හනුමා වන්නම නොවේ. පැරණි වන්නම් 18ට අයත්ය.)**

4. 4. 3. **විවෘත / සමූහ / නිර්මාණ වන්නම් / මිශ්‍ර /** **සැවුලා වන්නම**

- චරිතයේ ගති ස්වභාවය තීව්‍ර වන අයුරින් චලන යොදා ගනිමින් කස්තිරම, සීරුමාරුව, අඩව්ව ප්‍රාසාංගිකව නිර්මාණය කළ යුතු අතර වන්නමෙහි ව්‍යුහය ආරක්ෂා විය යුතුය.
- රංග වස්ත්‍රාභරණ නිර්මාණාත්මක විය යුතුය.
- විද්‍යුත් සංගීත භාණ්ඩ හැර වෙනත් ඕනෑම දේශීය හා පෙරදිග වාද්‍ය භාණ්ඩයක් යොදා ගත යුතුය.
- කාලය: අවම විනාඩි 5කි. උපරිම විනාඩි 7කි.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සඳහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

| 4. 5 ගැමි නැටුම් (9, 10, 11 ශ්‍රේණි සඳහා) | 501 - 1000/ 1000 ට වැඩි |
|---|---|

4. 5. 1. **විවෘත / සමූහ / ගැමි නැටුම් /ගැහැණු /** **කුළු**

4. 5. 2. **විවෘත / සමූහ / ගැමි නැටුම් / පිරිමි /** **කාලම්**

4. 5. 3. **විවෘත / සමූහ / ගැමි නැටුම් / මිශ්‍ර /** **සවරම්**

- විද්‍යුත් සංගීත භාණ්ඩ හැර වෙනත් ඕනෑම වාද්‍ය භාණ්ඩයක් යොදා ගත හැකිය.(ආදේශ භාණ්ඩද භාවිතා කළ හැක.)
- කාලය: අවම විනාඩි 5කි. උපරිම විනාඩි 7කි.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සඳහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

4. 6. 1. **විවෘත / සමූහ / ඉහි නළු /ගැහැණු /** **වෙස්සන්තර ජාතකය**

4. 6. 2. **විවෘත / සමූහ / ඉහි නළු / පිරිමි /** **ආලවක දමනය**

4. 6. 3. **විවෘත / සමූහ / ඉහි නළු / මිශ්‍ර /** **විජය කුවේනි කථාව**

- ඉහත තේමා ඇසුරින් නිර්මාණය ඉදිරිපත් කළ හැකිය.
- ගායනය යොදා ගත නොහැක.
- කලින් පටිගත කළ අනුවාදන ඉදිරිපත් කළ නොහැක.
- විද්‍යුත් සංගීත භාණ්ඩ හැර වෙනත් වාද්‍ය භාණ්ඩ යොදා ගත හැකිය. ආදේශ භාණ්ඩද යොදා ගත හැක.
- කාලය: අවම විනාඩි 10කි. උපරිම විනාඩි 15කි.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. වාදනය සඳහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

දෙමළ හා ජාත්‍යන්තර පාසල් 500 ට අඩු, 1000 ට අඩු, 1000 ට වැඩි වශයෙන් වෙන් වෙන්ව නොසලකන අතර සියලු පාසල් එක් වර්ගයක් සේ සලකනු ලැබේ.

## 4. 7 දෙමළ අංශය (07 - 11 ශ්‍රේණි සඳහා)

4. 7. 1. **සමූහ /ගැහැණු /** **සෙම්බු** (කළ)

4. 7. 2. **සමූහ / පිරිමි /** **කාලම්**

4. 7. 3. **සමූහ / මිශ්‍ර /** **කෝලාට්ටම්** ( ඊ කෙළි)

- අදාල වන වාදන භාණ්ඩ පමණක් යොදා ගත හැක.
- කාලය අවම විනාඩි 05 කි. උපරිම විනාඩි 07 කි.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සඳහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

## 4. 8 දෙමළ අංශය (07 - 11 ශ්‍රේණි සඳහා)

4. 8. 1. **සමූහ /ගැහැණු /** **ජෙතීශ්වරම්**

4. 8. 2. **සමූහ / පිරිමි /** **අලාරිප්පු**

- අදාල භාණ්ඩ පමණක් භාවිතා කළ හැක. (මෘදංගම්,වීණා, වයලීන්, තාම්පුරා, බටනලා, නටුවාංගනම්)
- කාලය අවම විනාඩි 05 කි. උපරිම විනාඩි 06 කි.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සඳහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

## 4. 9 දෙමළ අංශය (12 - 13 ශ්‍රේණි සඳහා)

4. 9. 1. **ජ්‍යෙෂ්ඨ / ඒකල /ගැහැණු /** **පදම්**

4. 9 . 2. **ජ්‍යෙෂ්ඨ / ඒකල / පිරිමි /** **වර්ණම්**

- ශාස්ත්‍රීය පද කොටස් පිළිබඳ අවධානය යොමු කරමින් අදාළ පද සමග ආරම්භයේ සිට අවසානය දක්වා.
- අදාළ වාද්‍ය භාණ්ඩ පමණක් භාවිතා කළ හැකිය.
- කාලය අවම විනාඩි 05 කි. උපරිම විනාඩි 07 කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි. ගායනය හා වාදනය සහිතව.**

## 4. 10 ජාත්‍යන්තර පාසල් (07 - 11 ශ්‍රේණි සඳහා)

4. 10. 1. **සමූහ / උඩරට /ගැහැණු /** **සුරපති වන්නම** (මාත්‍රා 3 +4 දෙතනි )

4. 10. 2. **සමූහ / උඩරට / පිරිමි /** **ගජගා වන්නම** (මාත්‍රා 4 තනි තිත විලම්භ ලය )

- සම්පූර්ණ වන්නම අදාල තිතට නටා ඊට අයත් කස්තිරම, සීරුමාරුව හා අඩව්ව නැටීමෙන් අවසන් කළ යුතුය.
- ගැටබෙරය හා තාලම්පට පමණක් වාදනය කළ යුතුය.
- කාලය: අවම විනාඩි 5කි. උපරිම විනාඩි 7කි.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සඳහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

**4. 11 ජාත්‍යන්තර පාසල් ගැමි නැටුම් (07 - 11 ශ්‍රේණි සඳහා)**

4. 11. 1. **සමූහ /ගැහැණු /** **චාමර**

4. 11. 2. **සමූහ / පිරිමි /** **කඩු සරඹ**

4. 11. 3 **සමූහ / මිශ්‍ර /** **ගොයම් කැපීම**

- ඉහත ගැමි නැටුම් ඇසුරින් නිර්මාණාත්මක රංගනයක් ඉදිරිපත් විය යුතුය.
- කාලය අවම විනාඩි 04. උපරිම විනාඩි 06 යි.
- යොදා ගත හැකි වාද්‍ය භාණ්ඩ, තාල වාද්‍ය භාණ්ඩ වලට අමතරව, සර්පිනාව, බටනලාව, ආදේශන භාණ්ඩ යොදා ගත හැක. විද්‍යුත් සංගීත භාණ්ඩ හා බටහිර සංගීත භාණ්ඩ භාවිතා කළ නොහැක.

**× සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 06 කි. උපරිම සංඛ්‍යාව 16 කි. ගායනය හා වාදනය සඳහා 08 කි. (සම්පූර්ණ සංඛ්‍යාව 24 කි.)**

**4. 12 ජාත්‍යන්තර පාසල් (12 - 13 ශ්‍රේණි සඳහා)**

4. 12. 1. **ජ්‍යෙෂ්ඨ / ඒකල /ගැහැණු /** **ආවැන්දුම**

4. 12. 2. **ජ්‍යෙෂ්ඨ / ඒකල / පිරිමි /** **යක් ඇනුම**

- ශාස්ත්‍රීය පද කොටස් පිළිබඳ අවධානය යොමු කරමින් අදාළ පද සමග ආරම්භයේ සිට අවසානය දක්වා. (ගැට බෙරය හා තාලම් පට පමණක් යොදා ගත හැකිය.)
- කාලය අවම විනාඩි 05 කි. උපරිම විනාඩි 07 කි.

**× සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි. වාදනය සහිතව.**


මෙම තරගය සඳහා ඉදිරිපත් වන සියලුම තරගකරුවන් හා සම්බන්ධවන අනෙකුත් පාර්ශවකරුවන් තරගයේ සෑම අවස්ථාවකදී ම මෙම තරග චක්‍රලේඛයේ සඳහන් **සියලු ම නීති රීති පිළිපැදීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත්,** එකඟ විය යුතු ය. **සාධන මට්ටම වන ලකුණු 45 උපයා ගැනීමට අපොහොසත් වන ප්‍රසංග අංක වල පාසල් තරගයෙන් ඉවත් කෙරේ. මෙය කලාප, පළාත් තරග වලදී ද වලංගු වේ.**

මෙම චක්‍රලේඛයෙහි දක්වා ඇති වගන්ති හා සීමාවන් එකකට හෝ කිහිපයකට හෝ පටහැනිව කටයුතු කොට ඇති බව අනාවරණය වුවහොත්, තරගයේ කුමන අවස්ථාවක දී වුව ද ප්‍රතිඵල ලේඛනවලින් එම විදුහල ඉවත් කිරීම, විනයානුකූල පියවර ගැනීම ඇතුළු අදාල වෙනත් තීරණ ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය සතුවේ.

**එච්. එම්. ගුණසේකර**
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2010. 12 ....


## ඇමුණුම 01



01. පිරිමි පුහුණු ඇඳුම් කට්ටලය



02. ගැහැණු පුහුණු ඇඳුම් කට්ටලය



03. ගැහැණු පුහුණු ඇඳුම් කට්ටලයේ හැට්ටයේ පිටුපස

01. පුහුණු ඇඳුම් සඳහා (ශිෂ්‍යයන් / ශිෂ්‍යාවන් ) යොදාගත යුතු (රෙදි වල) වර්ණය (පාට) තැඹිලි පාට වේ. කෝඩ්නූල් හෝ බේබි රිබන් තද රතුපාට විය යුතුය.

02. යොදාගත යුතු රෙදි වර්ගය වැලෙන්ජර් වේ.

03. හැට්ටයේ දකුණු උරහිස, වම් උරහිස හා පිටුපස කර, බෙල්ලේ සිට අගලක ප්‍රමාණයක් විවෘතව තිබිය යුතු අතර, ඉදිරිපස කර රවුම් හැඩයෙන් යුක්තව බෙල්ලේ සිට අගල් දෙකක ප්‍රමාණය විවෘතව සිටින සේ සැකසීම අනිවාර්ය වේ. හැට්ටයේ අත් වැලමිටේ සිට අගල් දෙකක් කොට වන සේ නිර්මාණය විය යුතුය. හැට්ටය විවෘත කිරීම ඉදිරිපස හෝ පිටුපසට නිර්මාණය කරගත හැකිය.

04. සාය හා හැට්ටය අතර ඉහ අගල් එකක ප්‍රමාණයක් විවෘත විය යුතු අතර, අනිවාර්යයෙන්ම නාභිය වැසෙන සේ සාය නිර්මාණය කර ගත යුතුය. සායෙහි උස දණහිසේ සිට අගල් 03 ක් කොට විය යුතුය.

05. හැට්ටයේ කර වාටිය, ඉණ වාටිය, අත් වාටි, සායේ පහළ වාටිය අගල් එකක ප්‍රමාණයක් ඉහලින් හා සිසුන් අදිනු ලබන රෙද්ද තද රතු කොඩි නූල් හෝ බේබි රිබන් යොදා අලංකාර කර ගත හැකිය.

ඇමුණුම 02.

**හනුමා වන්නම (පැරණි)**

මාත්‍රා 3 + 4 දෙකිත හා මාත්‍රා 3 තනි තිත

තානම - තත්ත තනත් තනෙනත් තනෙනත් තනෙනා //
තන තනාම් දන තනාම් තන තනාම් දනතනාම් //
තත්ත තනත් තනෙනත් තනෙනත් තනෙනා ........ ආ.................

කවි - රොත්ත පිටින් ඉඳ උස් මහගස් අතරේ //
දිග පිනුම්, ගැන දැනුම්, ඇති පිනුම්, කරු ලෙසින් //
පැන්න ගමන් එක පිම්මයකින් කදිමා ......................

අත්ත නමා පැටියන් තුරුළු කෙරෙමින් //
ගෙඩි කමින්, පැණි බොමින්, ගොරවමින්, නියවමින් //
දැක්ක දනන් බියපත් කරවන් වහමා .........................

හැත්ත පිරී සිටියත් වයසින් මහලු //
බිය සැකත්, නොව කිසිත්, ගල උඩත්, අතු යටත් //
එක්ව නටත් දුටුවොත් පැනයත් සැවොමා .................

නෙත්ත යොමා බල මුන්ගේ ගති මෙහෙමයි //
එම ගති, වල ඇතී, නළු ගතී, කර කැටී //
පාමු සභාතුල වන්නම මේ හනුමා ..........................

බෙර පදය, කස්තරම, සීරුමාරුව, අඩව්ව ඉහත තිත් රූපයට අනුව නිර්මාණය කර ගත යුතුය.

ඇමුණුම 03.

**විනිශ්චය සඳහා උපයෝගී කර ගත යුතු නිර්නායක.**

**ප්‍රාථමික අංශයේ සමූහ නැටුම්**

| | | |
|---|---|---|
| 1 | මාතෘකාවට උචිත බව | 10 |
| 2 | සාමූහික ගායන/ වාදන/නර්තනය | 20 |
| 3 | රංග වින්‍යාසය | 20 |
| 4 | උචිත චලන නිර්මාණ යොදා තිබීම | 20 |
| 5 | රංග උපකරණ හා රංග වස්ත්‍රාභරණ | 10 |
| 6 | ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ගේ ශක්‍යතා (නිපුනතා) | 10 |
| 7 | ප්‍රසාංගික බව හා සමස්ත නිමාව | 10 |
| | **එකතුව** | 100 |

**කෙළි නැටුම්/ ගැමි නැටුම්/ ගැමි නැටුම් නිර්මාණ**

| | | |
|---|---|---|
| 1 | මාතෘකාවට උචිත බව | 10 |
| 2 | ගායනය/ වාදනය හා තාල වල උචිත බව | 20 |
| 3 | රංග වින්‍යාසය | 20 |
| 4 | චලන නිර්මාණයේ උචිත බව | 20 |
| 5 | උපකරණ භාවිතය හා රංග වස්ත්‍රාභරණ | 10 |
| 6 | ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ගේ ශක්‍යතා (නිපුනතා) | 10 |
| 7 | ප්‍රසාංගික බව හා සමස්ත නිමාව | 10 |
| | **එකතුව** | 100 |

**සාම්ප්‍රදායික නැටුම් (උඩරට/ පහතරට/ සබරගමු) කණිෂ්ඨ - ජ්‍යෙෂ්ඨ - සමූහ**

| | | |
|---|---|---|
| 1 | සාම්ප්‍රදායික බව ආරක්ෂා වීම හා ශාස්ත්‍රීය බව | 20 |
| 2 | ගායන/ වාදන/නර්තනය තාල රූපයට අනුකූල වීම | 20 |
| 3 | නිවැරදි අංගහාර හා සිසු ශක්‍යතා | 20 |
| 4 | රංග වින්‍යාසය - අවකාශ භාවිතය තල දිසා, රංග රටා සම්බන්ධතා ගොඩ නැගීම | 20 |
| 5 | රංග වස්ත්‍රාභරණ හා උපකරණ භාවිතය | 10 |
| 6 | ප්‍රසාංගික බව හා සමස්ත නිමාව | 10 |
| | **එකතුව** | 100 |

**ඒකල නැටුම් (උඩරට/ පහතරට/ සබරගමු) කණිෂ්ඨ - ජ්‍යෙෂ්ඨ**

| | | |
|---|---|---|
| 1 | සම්ප්‍රදායික බව ආරක්ෂා වීම හා ශාස්ත්‍රීය බව | 20 |
| 2 | ගායනය/ වාදනය/ නර්තනය සඳහා තාල රූපයට අනුකූල වීම | 20 |
| 3 | නිවැරදි අංග හාර හා ශිෂ්‍ය ශක්‍යතා | 20 |
| 4 | රංග වින්‍යාසය - අවකාශ භාවිතය තල දිසා, රංග රටා සම්බන්ධය ගොඩ නැගීම | 20 |
| 4 | රංග වස්ත්‍රාභරණ හා උපකරණය භාවිතය | 10 |
| 5 | ප්‍රසාංගික බව හා සමස්ත නිමාව | 10 |
| | **එකතුව** | 100 |

**සමූහ වාදන**

| | | |
|---|---|---|
| 1 | තේමාවට උචිත බව | 10 |
| 2 | ශබ්ද නිර්මාණය සඳහා විවිධ උපක්‍රම භාවිතය | 25 |
| 3 | භාණ්ඩ සංකලනය මැනවින් යොදා ගෙන තිබීම | 20 |
| 4 | තේමාව සංවර්ධනය සඳහා නිවැරදි රංග රටා භාවිතය | 10 |
| 5 | වාදන ශක්‍යතාව | 25 |
| 5 | ප්‍රසාංගික බව හා සමස්ත නිමාව | 10 |
| | **එකතුව** | 100 |

**ඒකල/ අත්‍යා (යුගල) බෙර වාදනය (උඩරට/ පහතරට/ සබරගමු)**

| | | |
|---|---|---|
| 1 | අදාළ වට්ටම් තෝරා ගැනීම හා සම්ප්‍රදාය සුරැකීම | 30 |
| 2 | ලකුබුරුල ඇතිව වාදනය කිරීම | 20 |
| 3 | අලංකාර සුරල්/ පෙරලුම් භාවිතය | 10 |
| 4 | තාලය හා ලය පවත්වා ගැනීම | 10 |
| 5 | වාදන පිළිබඳ විශේෂ ශක්‍යතාව (නිපුනත්වය) | 20 |
| 5 | ප්‍රසාංගික බව හා සමස්ත නිමාව | 10 |
| | **එකතුව** | 100 |

**වන්නම් නිර්මාණ**

| | | |
|---|---|---|
| 2 | තේමාවට උචිත පරිදි සංදර්භය ගොඩ නැගීම | 20 |
| 3 | චලන නිර්මාණ වල උචිත බව | 15 |
| 4 | රංග වින්‍යාසය - අවකාශ භාවිතය තල දිසා, රංග රටා සම්බන්ධතා ගොඩ නැගීම | 20 |
| 5 | පසුබිම් වාදනය හා සංගීතය | 15 |
| 6 | සිසු ශක්‍යතා (නිපුනතා) | 20 |
| 7 | ප්‍රසාංගික බව, අපූර්වත්වය හා සමස්ත නිමාව | 10 |
| | **එකතුව** | 100 |

**මුද්‍රා නාට්‍ය**

| | | |
|---|---|---|
| 1 | තේමාවට අනුකූලව කතාව ගොඩනැගීම | 10 |
| 2 | උචිත පරිදි චලන යොදා ගැනීම. | 20 |
| 3 | පසුබිම් සංගීතය හා උචිත පසුතල නිර්මාණය | 20 |
| 4 | භාව ප්‍රකාශන හා අවස්ථා සම්බන්ධය තුලින් අර්ථරසය විදහා දැක්වීම | 20 |
| 5 | චරිත නිරූපනයේ ඖචිත්‍යභාවය | 10 |
| 6 | රංග උපක්‍රම හා උචිත රංග වස්ත්‍රාභරණ භාවිතය | 10 |
| 7 | ප්‍රසාංගික බව හා සමස්ත නිමාව | 10 |
| | **එකතුව** | 100 |

ඇමුණුම 04.

**ජායාරූප සහතික කිරීම.**

**(විදුහල්පති විසින් සම්පූර්ණ කිරීම සඳහා)**

සමස්ත ලංකා පාසල් නැටුම් තරගය - 2011

පාසලේ නම හා ලිපිනය :-

1. ශිෂ්‍යා/ශිෂ්‍යාවගේ නම :-

2. ඉගෙනුම ලබන ශ්‍රේණිය :-

3. උපන්දිනය :-

4. 2011.01.01 දිනට වයස :-

ඉහත සඳහන් ශිෂ්‍යයා/ශිෂ්‍යයාව මගේ පාසලේ අදාල ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවත්, ඔහු / ඇය පිළිබඳව දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

දිනය : - ..................................................        ..................................................

විදුහල්පති අත්සන

පාසල් මුද්‍රාව :

❖ **අධ්‍යාපන කලාපයේ/කොට්ඨාසයේ නැටුම් විෂයභාර නි.අ.අ./ස.අ.අ./ගුරු උපදේශකගේ නිර්දේශය.**

විදුහල්පති විසින් ඉදිරිපත් කර ඇති උක්ත ශිෂ්‍යයා/ශිෂ්‍යයාව පිළිබඳ තොරතුරු සත්‍ය හා නිවැරදි බවට නිර්දේශ කරමි.

අධ්‍යාපන කලාපය/කොට්ඨාස භාර නැටුම් නි.අ.අ./ස.අ.අ. /ගුරු උපදේශකගේ අත්සන -

නිල මුද්‍රාව හා දිනය :-

සැලකිය යුතුයි.

- ජායාරූප සහතික කිරීම සඳහා මෙම අයදුම්පත අදාළ අධ්‍යාපන කලාපයට/කොට්ඨාසයට යොමු කරන විට අදාල ශිෂ්‍යයා/ශිෂ්‍යයාවගේ උප්පැන්න සහතිකය පිටපතක් සමග ඉදිරිපත් කල යුතුය.

# ඇමුණුම 05

## ආදර්ශ අයදුම් පත්‍රය

(මෙම ආදර්ශයට අනුව අයදුම්පත පිළියෙල කර ගත යුතුය. අයදුම්පත සකස් කිරීමේදී යතුරු ලියනය හෝ පරිගණකය භාවිතා කිරීම අනිවාර්ය වේ. අතින් ලියා අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීමෙන් වලකිනු මැනවි. අයදුම් පත්‍රය ඒ4 කඩදාසියක (මෙම ප්‍රමාණයේ ) පමණක් අවශ්‍ය පරිදි සකස් කර ගත යුතුය.)

සමස්ත ලංකා පාසල් නැටුම් තරගය - 2011

❖ පාසල් වර්ගය ''''''''''''''''''''''''''''''''''''''''

(අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න)

| | |
|---|---|
| ශිෂ්‍ය සංඛ්‍යාව 500ට අඩු | |
| ශිෂ්‍ය සංඛ්‍යාව 501 -1000 අතර | |
| ශිෂ්‍ය සංඛ්‍යාව 1000ට වැඩි | |
| දෙමළ පාසල් අංශය | |
| ජාත්‍යන්තර පාසල් අංශය | |

01. විද්‍යාලයේ නම හා ලිපිනය :-

02. දුරකථන අංකය :-

03. විදුහල අයත් අධ්‍යාපන පළාත :-

04. විදුහල අයත් අධ්‍යාපන කලාපය :-

05. ඉදිරිපත් වන ප්‍රසංග හා නම් (චක්‍ර ලේඛය අනුව සටහන් කරන්න)

| | තරග ශිර්ෂය | ප්‍රසංග අංකය | ඒකල/සමූහ |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |

06. තරගයට සහභාගි වන ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ නාම ලේඛනය :-
:මුලකුරු ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න-

| | ශිෂ්‍යා/ශිෂ්‍යාවගේ නම | ගැහැණු/පිරිමි | ඉගෙන ගන්නා ශ්‍රේණිය | උපන් දිනය | අත්සන |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |

(සමූහ තරග වලදී අවශ්‍ය ආකාරයට සකස් කර ගත යුතුය.)

07. තරගය සඳහා සහාය 7.1 ගායනය

| | ශිෂ්‍යා/ශිෂ්‍යාවගේ නම | ගැහැණු/පිරිමි | ඉගෙන ගන්නා ශ්‍රේණිය | උපන් දිනය | අත්සන |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |

(සමූහ තරග වලදී අවශ්‍ය ආකාරයට සකස් කර ගත යුතුය.)

7.2. වාදනය

(වාදනය සඳහා ගුරුමහත්ම මහත්මීන් සහභාගිවන්නේ නම් ඔහුගේ/ඇයගේ නමට ඉදිරියෙන් මයා/මිය/මෙනවිය ලෙස සඳහන් කළ යුතුය.)

| | ශිෂ්‍යා/ශිෂ්‍යාවගේ නම | ගැහැණු/පිරිමි | ඉගෙන ගන්නා ශ්‍රේණිය | උපන් දිනය | අත්සන |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |

(සමූහ තරග වලදී අවශ්‍ය ආකාරයට සකස් කර ගත යුතුය.)

08. ප්‍රසංග අංක පුහුණු කල ගුරු මහතා/මහත්මිය/මෙනවිය

| ගුරුභවතාගේ නම | අත්සන |
|---|---|
| | |
| | |

09. සිසු/සිසුවින් භාරව පැමිණෙන ගුරුභවතුන්ගේ විස්තර.

| ගුරුභවතාගේ නම | උගන්වනු ලබන ප්‍රධාන විෂය | ජාතික හැඳුනුම්පත් අංකය | අත්සන |
|---|---|---|---|
| | | | |
| | | | |

(ගැහැණු තරග ඉසව්වක් නම් ගුරු මහත්මීන් ද පිරිමි තරග ඉසව්වක් නම් ගුරු මහත්වරුන් ද මිශ්‍ර තරග ඉසව්වක් නම් ගුරු මහත්ම/මහත්මී ද භාරකරුවන්සේ පැමිණිය හැක.)

මෙම තරගයට සහභාගිවන ශිෂ්‍යා/ශිෂ්‍යාවන් තරගය සඳහා ඉදිරිපත් වන තරග ඉසව්වට අදාල ශ්‍රේණිවල ඉගෙනුම ලබන බවත්, තරග චක්‍රලේඛනයේ දී ඇති සියළුම තරග කොන්දේසිවලට අනුකූලව තරග කිරීමට බැඳී සිටින බවත්, විනිශ්චය මණ්ඩලය ලබාදෙන තීරණය අවසන් තීරණය ලෙස පිළිගන්නාබවත්, සෑම අවස්ථාවකදීම මාගේ විදුහලේ සිසු/සිසුවියන් විනයගරුකව හැසිරවීමේ වගකීම මා පෞද්ගලිකව භාරගන්නා බවත්, සහතික කොට ප්‍රකාශ කරමි.

**ගුරුභවතාගේ අත්සන - ........................................**
**ගුරුභවතාගේ නම - ........................................**
**දිනය :-- ........................................**

**විදුහල්පතිගේ අත්සන**

**විදුහල්පතිගේ නම හා පාසල් මුද්‍රාව**

**දිනය :-**

සැලකිය යුතුය :-
තරගයට ඉදිරිපත් කරනු ලබන සියළුම ශිෂ්‍යා/ශිෂ්‍යාවන් තරග ඉසව්වට අදාල ශ්‍රේණිවල/ශ්‍රේණියේ ඉගෙන ගන්නාබව හා නාමලේඛන පරීක්ෂාකර බලාඅත්සන් කිරීම විදුහල්පතිගේ වගකීමකි.